# 2016 අංක 16 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත සඳහා මාර්ගෝපදේශය

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

2016 ඔක්තෝබර්

**2016 අංක 16 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත සඳහා මාර්ගෝපදේශය**

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසිනි**

**2016 ඔක්තෝබර්**

2016 අගෝස්තු මස 25 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) (සංශෝධන) පනත ඒකමතිකව සම්මත කරගන්නා ලදි. මෙම පනත මඟින් දක්නට නොමැති බවට වන සහතික නිකුත් කිරීම සඳහා ප්‍රතිපාදන සපයයි. මෙම මාර්ගෝපදේශය මඟින් පනතේ ප්‍රධාන අංගයන් පිළිබඳව කෙටියෙන් සළකා බලනු ලැබේ.

දක්නට නොමැති බවට වන සහතික වින්දිතයන් සඳහා සංකේතාත්මකවත් ප්‍රායෝගිකවත් ඉතා වැදගත් වේ. එය රජය විසින් නිල වශයෙන් ඉදිරිපත් කරනු ලබන නිල ලේඛනයක් වන අතර එමඟින් පුද්ගලයන් කොපමණ සංඛ්‍යාවක් එක්කෝ අතුරුදහන්ව නැත්නම් සොයාගත නොහැකිව පවතීද යන්න පෙන්නුම් කරයි. මෙය අතුරුදහන් වූ තම ආදරණීයයන් සොයමින් පවතින පවුල් සඳහා ඉතා වැදගත් පියවරක් වන අතර අතුරුදහන් වූවන් තවමත් ජීවතුන් අතර පවතින බවට බලාපොරොත්තුවක්ද වේ. ප්‍රායෝගික තලයේදී, දක්නට නොමැති බවට වන සහතිකය ඇතැම් ප්‍රතිලාභ ලබා ගැනීමට පහසුකම් සැළසීම, දේපළ හා පහත සඳහන් වෙනත් ගැටලු සඳහාද විසඳුම් සපයයි.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දක්නට නොමැති බවට වන සහතික හඳුන්වා දීමේ මූලිකත්වය ඇතුළුව සංක්‍රාන්තික යුක්තියට අදාළ බොහෝ ප්‍රතිසංස්කරණ පිළිබඳව පක්ෂව කටයුතු කරමින් සිටී. වර්තමාන පනත හරහා අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුල් මුහුණ දෙන ගැටලු ආමන්ත්‍රණය කරන අතර අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව අදාළ පනත ක්‍රියාවේ යොදවන ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අදාළ අධිකාරීන්ගෙන් ඉල්ලා සිටී. දක්නට නොමැති බවට වන සහතික පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් සම්පාදනය කරන ලද වාර්තාවන් පහත යොමු හරහා ලබාගත හැකිය. www.cpalanka.org හා www.tjsrilanka.org

## දක්නට නොමැති බවට වන සහතිකය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය නිර්ණායක

8 අ (1) වගන්තිය දක්වන පරිදි අතුරුදහන් වූ බවට වාර්තාගත වූ හෝ වසරක කාලයකට වඩා කිසිවක් සොයාගත නොහැකි පුද්ගලයෙකු වෙනුවෙන් දක්නට නොමැති බවට වන සහතිකයක් සඳහා අයදුම්කළ හැකිය.

8 අ (1) වගන්තියට අනුව අතුරුදහන් වීම පහත අවස්ථාවන්ට ආරෝපණය විය යුතුය.

- උතුරු හා නැගෙනහිර පැවැති ගැටුම්වලදී හෝ ඊට පසුව
- හෝ දේශපාලන කැලඹීම් හෝ සිවිල් ගැටුම් හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම්
- හෝ ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ බවට හඳුනාගත් සන්නද්ධ හමුදාවන්වල හෝ පොලිසියේ සාමාජිකයෙක්.

## දක්නට නොමැති බවට වන සහතිකයක් සඳහා අයදුම් කළ හැක්කේ කාටද?

දක්නට නොමැති බවට වන සහතිකය ලබා ගැනීම සඳහා ඥාතියෙකුට අයදුම් කළ හැකිය. 8 අ (1) වගන්තිය.

14 වගන්තියට අනුව "ඥාතියා" යන්නට පහත සඳහන් පුද්ගලයන් අතුළත් විය හැකිය.

i. කලත්‍රයා;
ii. දරුවන්,හදාගත් දරුවන්, අවිවාහජ දරුවන් හෝ සුළු දරුවන්;
iii. දෙමාපියන්(කුඩම්මා, කුඩප්පා හා හදාවඩාගත් තැනැත්තා);
iv. පූර්ණ හෝ අර්ධ සහෝදර සහෝදරියන් හෝ හදාවඩාගත් සහෝදර සහෝදරියන්;

v. මාමණ්ඩිය/නැන්දණිය, මස්සිනා/නෑනා, බෑණා/ලේලි;
vi. මුණුබුරු මිණිබිරියන් හා මුත්තණු මිත්තණියන්

## අවශ්‍ය ලිපි ලේඛන කවරේද?

8 (ආ) වගන්තිය දක්වන්නේ අයදුම් කරන්නා පහත දැක්වෙන ලිපි ලේඛන ඇමිණිය යුතු බවයි.

- අයදුම්කරන්නා විශ්වාස කරන පරිදි කුමන පදනමක් මත අදාළ පුද්ගලයා අතුරුදහන් වූ අයෙකු ලෙස ලියාපදිංචි කළ යුතු වන්නේද යන්න සඳහන් කරමින් දිව්රුම් ප්‍රකාශයක්.
- අතුරුදහන් වූ අයෙකු ලෙස ලියාපදිංචි කිරීමට උත්සාහ කරන පුද්ගලයා පසුගිය පදිංචිකරුවෙකු හෝ ස්ථිර පදිංචිකරුවෙකු බව සහතික කරමින්, එම පුද්ගලයා වසරකට වඩා කාලයක් දක්නට හෝ ඇසීමට හෝ නොමැති බව දක්වමින් එම පුද්ගලයා අයත් ග්‍රාමසේවා වසමේ ග්‍රාම නිළධාරීගෙන් වාර්තාවක්
- අයශුම්පත සනාථ කිරීමට කුමන හෝ සාක්ෂියක්

## ක්‍රියාපටිපාටිය කුමක්ද?

8 (අ) (2) වගන්තිය දක්වන පරිදි,රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයා වෙත හෝ අතුරුදහන් වූ තැනැත්තා අවසන් වරට පදිංචිව සිටි හෝ ඔහුගේ ස්ථිර වාසස්ථාන පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත හෝ ඉදිරිපත් කළ යුතුය.

8(ඇ) රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයා විසින් හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ඉල්ලීමේ පිටපතක් තමාගේ කාර්යාලයේ දැන්වීම් පුවරුවේද, අදාළ ග්‍රාම නිළධාරියාගේ කාර්යාලයේද, සති දෙකක කාලයක් ප්‍රදර්ශනය කළ යුතුය.

8(ඈ) ප්‍රදර්ශනය කරන ලද දිනයේ සිට මාසයක් ඇතුළතදී එම ඉල්ලීම අදාළ වන තැනැත්තා අතුරුදහන් වී ඇති බවට ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් හෝ ඥාතියා පත් කිරීම සම්බන්ධයෙන් විරෝධතා ඇත්නම් එම විරෝධතා පහත දෑ සමගින් ඉදිරිපත් කළ යුතුය.

- විරෝධතා පෑමට හේතු පැහැදිලිව දක්වමින් විරෝධය පාන්නා හෝ වෙනත් යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරනු ලබන දිව් රුම් ප්‍රකාශයක්.
- විරෝධතාවන්ට සහාය විය හැකි සාක්ෂි.

ඉල්ලීමකට විරෝධතා ඉදිරිපත් කිරීම සඳහා ඉඩ දී ඇති එක් මාසයක කාලසීමාව ඉකුත් වූ පසු, ඒ ඉල්ලීම සහ යම් විරෝධතාවයක් ඇත්නම් ඒ විරෝධතා තහවුරු කිරීමට ඇති සාක්ෂිද සමඟ අවස්ථාවෝචිත පරිදි, ඒ ඉල්ලීම රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයා විස්නින් හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් සළකා බැලිය යුතුය. රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයා හෝ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් යම් තැනැත්තෙකුගෙන් ප්‍රශ්න කිරීම හෝ යම් සාක්ෂි කැඳවීම සහ ඔහු විසින් අවශ්‍ය යැයි සළකනු ලබන යම් පරීක්ෂණයකින් පසු ඉල්ලීමේ සඳහන් කරුණුවල සත්‍යතාව පිළිබඳ තමා සෑහීමකට පත් වන්නේ නම් ඒ ඉල්ලීමට ඉඩදිය යුතුය.

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා එම තොරතුරු අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ රෙජිස්ටරයේ ඇතුළත් කළ යුතු අතර දක්නට නොමැති බවට වන සහතිකය ඥාතියාට නිකුත් කළ යුතුය. රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයා අදාළ තොරතුරු 8(ඌ)(1) වගන්තියට අනුව ඉලෙක්ට්‍රොනික රෙජිස්ටරයට ඇතුළත් කළ යුතුය.

## පරීක්ෂණ කොමිෂන් සභා/විශේෂ ජනාධිපති කොමිෂන් සභා/ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අනාවරණය කරගනු ලැබූ අතුරුදහන් වූ පුද්ගලයන්

යම් තැනැත්තෙකු අතුරුදහන් වූ හෝ සොයාගත නොහැකි බවට පහත ආයතන සොයා ගතහොත්,

- 393 අධිකාරිය වූ පරීක්ෂණ කොමිෂන් සභා පනත යටතේ පත් කරන ලද කොමිෂන් සභාවක්.

- හෝ 1978 අංක 07 දරන විශේෂ ජනාධිපති කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින්.
- හෝ 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත යටතේ පිහිටවනු ලැබූ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය.

අදාළ පුද්ගලයාගේ ඥාතියා විසින් දක්නට නොමැති බවට වූ සහතිකයක් තමා වෙත නිකුත් කරන ලෙස රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයා හෝ එම අතුරුදහන් වූ තැනැත්තා අන්තිමට පදිංචිව සිටි ප්‍රදේශයේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය. එම අයදුම්පත පහත දෑ සමඟින් සමන්විත විය යුතුය.

- ඒ තැනැත්තා අතුරුදහන් වී ඇති බවට තමාට විශ්වාස කිරීමට ඇති හේතු සඳහන් කරමින් ඉල්ලුම්කරුගේ දිවි රුම් ප්‍රකාශයක්.
- ඒ තැනැත්තාට අදාළව පරීක්ෂණ කොමිෂන් සභාව හෝ විශේෂ ජනාධිපති කොමිෂන් සභාව හෝ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අතුරු වාර්තාව හෝ වාර්තාව විසින් අනාවරණය කරගනු ලැබූ කරුණුවල සහතික පිටපතක්.

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා තොඅර්තුරු සමඟ වාර්තාවක් රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයා වෙත යැවිය යුතු අතර ඔහු විසින්  එය සළකා බලා අදාළ සිඩ්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාට අදාළ පුද්ගලයා අතුරුදහන් වූ පුද්ගලයන්ගේ රෙජිස්ටරයේ ලියාපදිංචි කර දක්නට නොමැති බවට වූ සහතිකයක් ලබා දීමට විධාන කළ හැකිය. රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයා එම තොරතුරු ඉලෙක්ට්‍රොනික රෙජිස්ටරයට ඇතුළත් කළ යුතුය.

## දක්නට නොමැති බවට වූ සහතිකය පහත අවස්ථාවලදී ඥාතීන්ට භාවිත කළ හැකිය

- යම් සමාජ සුබ සාධන යෝජනා ක්‍රමයක් යටතේ ප්‍රතිලාභ සඳහා ඉල්ලුම් කිරීමට.
- දිසා අධිකරණයේ අධීක්ෂණය යටතේ තාවකාලිකව අතුරුදහන් වූ තැනැත්තාගේ දේපළ සහ වත්කම් පාලනය කිරීමට සහ අතුරුදහන් වූ තැනැත්තාගේ යැපෙන දරුවන් වෙනුවෙන් තාවකාලික භාරකරුවෙකු සේ ක්‍රියා කිරීමට.

8 (ඒ ) (2) වගන්තිය දක්වන ආකාරයට අධිකාරී බලයක් ඇති සියලු ආයතන සහ තැනැත්තන් විසින් අතුරුදහන් වී ඇති තැනැත්තාගේ තත්ත්වය තහවුරු කිරීම සඳහා දක්නට නොමැති බවට වූ සහතිකය පිළිගෙන භාරගත යුතුය.

## අභියාචනා

දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයාගේ තීරණයන් අතෘප්තියට පත් අයදුම්කරුවකු මාසයක කාලයක ඇතුළත රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයාට අභියාචනා කළ හැකිය. 8 (ඊ) වගන්තිය තවදුරටත් දක්වන්නේ රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් අයදුම්කරුවෙකු හෝ අයදුම්පත්‍රයට විරෝධතා පාන්නා වූ අයෙකු මාසයක කාලයක ඇතුළත දිස්ත්‍රික් අධිකරණයට අභියාචනා කළ හැකිය.

## වලංගුභාවය

5(2) වගන්තිඅයට අනුව පනතේ යම් යම් කොටස් ක්‍රියාත්මක කිරීමේ කාලය වසර 5 කාලයක් දක්වා දීර්ඝ කළ හැකිය. එම කොටස් ක්‍රියාත්මකව පැවතීමට නියමිත යම් කාලසීමාවක් ඉකුත්වීමට එක් මසකට නොඅඩු කාලයකට පෙරාතුව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් එවැනි කාලසීමාව දීර්ඝ කරනු ලැබිය හැකිය.

8(ඔ ) (1) වගන්තිය දක්වන්නේ දක්නට නොමැති බවට වූ සහතිකය එහි නිශ්චිතව සඳහන් දිනයේ සිට අවරුදු දෙකක කාලයක් සඳහා වලංගුව පැවතිය යුතුය.

අතුරුදහන් වූ තැනැත්තාගේ ශරීරයේ ශේෂයන් සොයාගනු ලැබුවහොත් හෝ අතුරුදහන් වූ තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් වෙනත් තීරණාත්මක සාක්ෂි සොයාගනු ලැබුවහොත් එවැනි විටෙක දක්නට නොමැති බවට වූ සහතිකය අවලංගු කරනු ලැබිය යුතු අතර මරණ සහතිකයක් නිකුත් කළ යුතුය.

දක්නට නොමැති තැනැත්තා ජීවත්ව සිටින බවට සොයා ගනු ලැබුවහොත් රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයා ලියාපදිංචිය අවලංගු කිරීමට සහ දක්නට නොමැති බවට වූ සහතිකය අවලංගු කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගත යුතුය.

එකී අවුරුදු දෙකක කාල සීමාව අවසන්වීමෙන් පසුව, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරයා විසින් දකනට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කර ඇති ඥාතියාගෙන් අතුරුදහන් වීමට අදාළ තත්ත්වය පිළිබඳ විමසිය යුතු අතර එහිදී පහත ක්‍රියාමාර්ග විවෘතව පවතී.

- තවත් අවුරුදු දෙකක කාලයක් සඳහා දක්නට නොමැති බවට වූ සහතිකය දීර්ඝ කිරීම.
- මරණ සහතිකයක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමට ඥාතියා කැමැත්තෙන් සිටී නම් එම ඉල්ලීම ඉදිරිපත් කරන ලෙස එම තැනැත්තාට විධාන කර ලියාපදිංචිය අහෝසි කිරීමට පියවර ගෙන දක්නට නොමැති බවට වූ සහතිකය අවලංගු කළ යුතුය.
- ඥාතියා එකී සහතිකයේ කාල සීමාව දීර්ඝ කර ගැනීමට අපේක්ෂා කරනු නොලබන්නේ නම් දක්නට නොමැති බවට වූ සහතිකය අවලංගු කිරීම.

## මරණ සහතිකය

2005 අංක 17 දරණ මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනතේ 8 වන වගන්තිය අනුව අතුරුදහන් වූ හෝ සොයාගත නොහැකි අයවලුන් ලෙස වාර්තා වී ඇති පුද්ගලයන් සඳහා මරණ සහතික ලබාගත හැකිය. කෙසේ වෙතත්, සංශෝධනයේ 7 වන වගන්තිය දක්වන්නේ දක්නට නොමැති බවට වන සහතිකයක් නිකුත් කළහොත්, එම පුද්ගලයා උදෙසා දක්නට නොමැති බවට වන සහතිකය අවලංගු කරන තෙක් මරණ සහතිකය නිකුත් කරනු නොලබයි.

## මරණ සහතිකයක් දක්නට නොමැති බවට වන සහතිකයක් බවට පත් කිරීම

8(ඕ) වගන්තිය දක්වන්නේ අතුරුදහන් වූ තැනැත්තාගේ ඥාතීන්ට මරණ සහතිකය ලැබී ඇත්නම් හෝ මරණ සහතිකයක් ලබා ගැනීමට අයදුම්කර ඇත්නම්, වත්මන්ව ඔවුන් හට 8 (උ) යටතේ දක්නට නොමැති බවට වන සහතිකයක් ලබා ගැනීමට අයදුම් කළ හැකිය. එවිට රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයා එම මරණ සහතිකය හෝ මරණ සහතිකය ලබා ගැනීමට සිදුකර ඇති අයැදුම අවලංගු කර ඒ වෙනුවට දක්නට නොමැති බවට වන සහතිකයක් නිකුත් කළ යුතුය.

## වරදවල්

ජීවත්ව සිටින අයෙකු අතුරුදහන් වූ තැනැත්තෙකු ලෙස ලියාපදිංචි කිරීමට රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයා වෙත තොරතුරු සපයා ඇති අවස්ථාවක් එය වරදක් වේ. පනත යටතේ සහතිකය නිකුත් කර ඇත පුද්ගලයා ජීවත්ව සිටින බව දනිමින් හෝ විශ්වාස කිරීමට කරුණු තිබියදී අව්‍යාජව හෝ වංචනිකව එම දක්නට නොමැති බවට වන සහතිකය භාවිත කර ඇත්නම් එයද වරදකි.